**පාඩම 21**

**නිවේදනය කියවා ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.**

**අප පාසලේ අලුතින් ඉදි කරන ලද ක්‍රියාකාරකම් කාමරය විවෘත කිරීමේ උත්සවය 2021 ජුනි මස 10 වන බදාදා පෙරවරු 10.00 ට පැවැත්වේ.**

**ප්‍රධාන ආරාධිත අමුත්තා වශයෙන් ගරු අධ්‍යාපන ඇමතිතුමා සහභාගී වෙයි. එදින සියලු සිසුන් පාසල් නිල ඇඳුමින් පැමිණිය යුතු අතර ප්‍රධාන ගේට්ටුව අසල සිට ප්‍රධාන ශාලාව දක්වා පාර දෙපස පෙළ ගැසී සිටිය යුතු ය. දෙමව්පියන් අනිවාර්යයෙන් ම උත්සවයට සහභාගී විය යුතු අතර ඔවුන් පෙරවරු 9.30ට පෙර ප්‍රධාන ශාලාවේ අසුන් ගත යුතු බව සංවිධායක මණ්ඩලය දැනුම් දෙයි.**

1. **මෙම උත්සවය කුමක් සඳහා ද ? .....................................**
2. **උත්සවය ආරම්භ වන්නේ කීයට ද? .................................**
3. **උත්සවයේ ප්‍රධාන ආරාධිතයා කවු ද ? ................................**
4. **සියලු සිසුන් පාසලට පැමිණිය යුත්තේ කෙසේ ද?.............................**
5. **දෙමව්පියන් ශාලාවේ අසුන් ගත යුත්තේ කීයට ද? ............................**

**පාඩම 22**

**නුවණැති නායකයා**

**ක්‍රියාකාරකම 1**

කතන්දරයට අනුව වැකි නිවැරදි නම් " හ" අකුර ද වැරදි නම් "වැ" අකුර ද කොටුව තුළ ලියන්න.

1. පන්සියයක් ගැල් කණ්ඩායමේ නායකයා සිටුවරයා ය. ☐
2. ගැල් කණ්ඩායම වනාන්තරයේ මැදට පැමිණි විට ඒ අසල ගම්මානයක් තිබුණේ ය. ☐
3. ගැල් කණ්ඩායම අඹ ගසකට සමාන දැකුම්කලු විශාල වෘක්ෂයක් දුටුවේ ය. ☐
4. නායකතුමා ගස ළඟට පැමිණ ගස ද එල ද හොඳින් පරීක්ෂා කළේ ය. ☐
5. කිම්එල විෂ රහිත බව නායකතුමා පැවසුවේ ය. ☐